

# මිතුරාගේ දිනපොත

නරුමසේකර ලියා තිබූ ''රාජ්‍ය සේවකයාගේ වස්තු'' කියවා හමාර කළ මගේ මුවගට නැගුනේ මඳ සිනහවකි. මම ඊළඟ පිටුව පෙරලුවෙමි. එහි ලොකු අකුරින් ලියා තිබුණු මාතෘකාව දුටු මට සිහිවූයේ ධර්මසේන හිමියන්ගේ සද්ධර්ම රත්නාවලියේ එන එක් කතාවක මාතෘකාවයි. නරුමසේකර යොදා තිබුණු නම ''එක්තරා පුද්ගලයකුගේ වස්තුව'' ය.

## එක්තරා පුද්ගලයකුගේ වස්තුව

කුවේරරත්න විවාහ හා උප්පැන්න ලියාපදිංචි කාර්යාලයෙන් පිටවෙන විට අඳුර වැටී තිබිණි. තමන් පැමිණි රාජකාරිය අදම අවසන් කර ගන්නට හැකිවීම ගැන ඔහුගේ සිතේ දැඩි සතුටක් ඇතිවූවද පිංගුත්තර මහතාගේ දහඩියෙන් පෙඟුණු මුහුණත් විඩාපත් දෑසත් දෙස බැලූ ඔහුගේ සිතට මඳ ශෝකයක් ඇතිවිය. පැය එකහමාරක පමණ කාලයක් ලිපි ගොණු සහිත පයිල් කවර අවුස්සා බලා තම උප්පැන්න සහතිකයේ පිටපත් කිහිපයක්ම පිංගුත්තර මහතා විසින් ලබාදීම ගැන ඔහුට කෙසේ ස්තුති වන්නදැයි සිතමිනි. ඔහු කාර්යාලයෙන් පිටවූයේ උප්පැන්න සහතිකයේ පිටපත් ලබාගැනීමේදී කිහිපවරක්ම මුද්‍රණය වුණු අඳුරු පැහැති පිටපත් කිහිපයක්ම ඉවත ලා පැහැදිලි පිටපත් ලබාදීමට පිංගුත්තර මහතා දැරූ උත්සාහය සිහිකළ කුවේරරත්න තුළ පිංගුත්තර මහතා කෙරෙහි ඇතිවූයේ දැඩි සෙනෙහසකි.

කුවේරරත්න බස් නැවතුම් පොළට යනවිට අවට අඳුර පැතිරෙමින් තිබිණි. පොලිස් කොස්තාපල්වරුන් දෙදෙනෙකු මහළු කාන්තාවක දෙපසින්ම අල්ලා ගෙන පාර මාරුවීමට ඇයට උදව් වනසැටි කුවේරරත්න දුටුවේය. පාර හරහා සෙමෙන් ඇදී යන වාහන දෙස මඳ වේලාවක් බලා සිටි කුවේරරත්න ඉදිරියේ හදිසියේම නව පන්නයේ ජීප් රථයක් නැවතිණි. රජයේ නිල මුද්‍රාව සහිත එම  රිය. මන්ත්‍රීවරයකුට හෝ ඇමැතිවරයකුට අයත් නිල රථයක් විය හැකි යැයි කුවේරරත්නට සිතිණි. එකෙනෙහිම රථයෙන් බැස ආ කෙසඟ සිරුරක් ඇති උස පුද්ගලයා ප්‍රාදේශීය මහ ඇමැතිවරයා බව කුවේරරත්නට වහා වැටහිණි

''ලොකු උන්නැහේ නගින්න. කොහාටද යන්නෙ?'' ඇමැතිවරයාගේ ආරාධනයෙන් පහත් වූ සිතැති කුවේරරත්න සුඛෝපභෝගී වාහනය තුළට එබී බැලුවේය. පමා වී සැන්දෑවේ නිවෙස් බලා යන මිනිසුන් ගැහැණුන් හා කුඩා දරුවන් පිරිසක් ද වාහනය තුළ අසුන් ගෙන ඇති බව ඔහු දුටුවේය. පළාතේ මහ ඇමැතිවරයා සෑම දිනකම රෑ බෝවී ගෙදර යන මගීන් තම නිල රථයේ නංවා ගෙන ඔවුන්ගේ නිවෙස්වලට ඇරලන බව කුවේරරත්න දැන සිටියේය.

''මම කේතුමති යන්නේ. මහත්තයා යන්න. මට තව පොඩ්ඩකින් බස් එකක් එනවා''

''ලොකු උන්නැහෙ විනාඩි දහයක් හිටියොත් මම මේ තුන්දෙනාත් බස්සලා ඉක්මනට එනවා. එතකොට හොඳට සැප පහසුවට ඉඳගෙන ගියෑකි.''

''නෑ මහත්තයා මම යන්නම්. අර එන්නෙ කේතුමතී පුරයට යන බස් එක''

''හොඳමයි ප්‍රවේසමෙන් යන්න' යි අහිංසක සිනහවක් පාමින් හිස නමා ආචාර කළ මහ ඇමැතිවරයා ඔහුගේ රථයට නැග රියදුරු අසුනේ හිඳ ගත්තේය.

කුවේරරත්න බස් නැවතුම් පොළට කඩිමුඩියේ ගමන් කරන අතරේදීම මහජන ප්‍රවාහන සේවයේ බස් රථය ඔහු අසලින්ම නැවැත්වීය. ඔහු බස් රථයට නැග ප්‍රවේශ පත්‍රය මිලදී ගන්නා තෙක්ම බසය නවත්වා ගෙන සිටි රියදුරා නැගිට බසය පසුපස බැලුවේ කුවේරරත්නට හිඳ ගැනීමට ආසනයක් ඇත්දැයි සොයා බැලීමටය. රථයේ කෙළවර අසුන් දෙකක් ඇති බව දුටු කුවේරරත්න ඒ දෙසට ගමන් කළේය. ඔහු අසුනක හිඳ ගන්නා තෙක්ම රියදුරා බස්



ආචාර්ය පාලිත ගනේවත්ත

රථය ධාවනය නොකර බලා සිටියේය. කුවේරරත්න පසුපස ආසනයට ලඟාවීමට පෙර ඊට ආසන පේළි දෙකකට කලින් හිඳ සිටි තරුණ කාන්තාවක් ඔහුට ආසනය පිළිගන්වනු පිණිස නැගී සිටියාය.

''නෑ දුව ඉඳගන්න. මට පිටි පස්සෙත් සීට් එකක් තියෙනවා'' යි කුවේරරත්න තරුණ කත දෙස බලමින් කීවේය. ඇය ගැබ්බර කාන්තාවක් බව කුවේරරත්නගේ ඇස ගැටුනේ ඇය සිනාමුසු මුහුණින් යළිත් ඇයගේ අසුනේ හිඳ ගන්නා විටය. කුවේරරත්න අසුනේ හිඳ ගන්නා තෙක්ම පසුපස බලාසිටි රියදුරා හෙමින් සීරුවේ සුක්කානම කරකවමින් බසය ඉදිරියට ගෙන ගියේය.

බසයේ කවුළුව තුළින් වටපිට බලන කුවේරරත්න සැනසුම් සුසුමක් හෙලුවේ දුර බැහැර සිට පැමිණියත් එදිනම තම අවශ්‍යතාව ඉටුකර ගැනීමට හැකිවීම නිසාය. පිංගුත්තර මහතා ඇතුළු විවාහ හා උප්පැන්න කාර්යාලයේ සේවක පිරිසගේ ඇති කැපවීමත් රාජකාරියට ඇති උනන්දුවත් යළිත් සිහිපත් කළ කුවේරරත්න තුළ ඇතිවූයේ අප්‍රමාණ සතුටකි.

පැය දෙකක ගමනින් පසු තමන් බැසිය යුතු තැන බසය නැවැත්වූ විට කුවේරරත්න සෙමින් බසයේ ඉදිරි දොරටුව වෙත ගියේය. ඔහු බලාපොරොත්තු වූ පරිදිම රියදුරු මහතා බසය නතර කර නැගී සිටියේ කුවේරරත්නට බසයෙන් බැසීමට උපකාරවීම සඳහාය. මහළු වයසට පත්ව සිටින කුවේරරත්න නොවැටී බසයෙන් බැස්සවීම තම යුතුකම ලෙස සැලකූ රියදුරා, -කුවේරරත්නගේ දකු-ණතින් අල්වා රථයේ පඩිපෙලින් බස්සවා මඳ වේලාවක් බලා සිටියේ කුවේරරත්න බසයෙන් ඈත්ව පා නඟන තෙක්ය. අනතුරුව බසයට ගොඩවී යළිත් රිය පණගන්වා ගමන පටන් ගත් ඔහුට සිතුනේ රෑ බෝවූ මේ යාමයේ කුවේරරත්න නිවසට ළඟාවන සැටිය.





